**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව - 2025**

-----------------------------------------------

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සබරගමුව අනභිබවනීයත්වයට.

**1.2 මෙහෙවර**

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙර ගමනකට.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 59,818 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 51,054.8 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 8,763.2 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14.65 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 50,607.00 | 46,994.7 | 3,612.3 | 7.14 |
| මූලධන | 9,211.00 | 4,060.1 | 5,150.9 | 55.92 |
| එකතුව | 59,818.00 | 51,054.8 | 8,763.2 | 14.65 |

**3. විගණන නිරීක්ෂණය**

2025 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 74 ක් පරිපූරක ප්‍රතිපාදන මගින් අනුමත කර තිබුණි. පළාත් සභාව විසින් 2025 වර්ෂය තුළ දී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. ඒ හැර ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.